සන්නස
SANNASA



# මගේ ලෝකය

*There is only one happiness in this life,
to love and be loved. ..*

> අපේ ලෝකය සුවඳවත් කරන්නේ මල් වැනි අපේ දරුවෝ වෙති. ඔවුන්ගේ ලෝකය සෞන්දර්යයෙන් පුරවාලීම වැඩිහිටියන්ගේ වගකීමකි.

## මෙල්බන් ළමා වේදිකාවේ මැජික්කාරයන් දෙදෙනා

# කුසුම්සිරි සහ යශෝධරා

වසර විස්කරට පමණ පෙර අතීතයකට සිත දුවයි. ඒ මම මගේ පළමු කෙටිකතා පොතේ පිටපතක් මගේ නැන්දනියගේ ලොකු පුතා අතට දුන් දවසයි. ඒ කාලයේත් පරිගණක විශේෂඥයකු වූ ඒ තරුණයා මා දෙස බැලුවේ පුදුමයෙනි.

"මං මගෙ ජීවිතේට පාඩම් පොතක් ඇරෙන්න වෙනින් පොතක් කියවලා නෑ අයියෙ" ඔහු කීවේ ය.

ඒ, මා එවන් කතාවක් ඇසූ පළමු වතාවයි. ජීවිතේ කිසිම දිනෙක නවකතාවක්, කෙටිකතාවක්, කවියක් හෝ වෙනයම් නිර්මාණාත්මක දෙයක් නොකියවූ එහෙත් උසස් අධ්‍යාපනය ලද අය සිටිති ය යන්න එදා මට අදහාගත නොහැකි තරමේ ප්‍රවෘත්තියක් විය. එහෙත් දැන් ඒ ගැන මට පුදුමයක් නොදැනෙයි. ලංකාවේ බහුතරයක් දරුවෝ පාඩම් පොත පතින් බැහැරව වෙනත් යමක් නොකියවන්නෝ ය යන්න දැන් මම පැහැදිලිවට වටහාගෙන සිටින්නෙමි. මෙය අප කම්පා විය යුතු තත්වයක් නොවේ ද? සෞන්දර්යය නොහඳුණන පරම්පරාවක් බිහිවීමේ වරද ඇත්තේ කොතැනක ද?



දරුවන් බොහෝ සෙයින් පොත පත කියවන ඔස්ට්‍රේලියානු සමාජයේ ජීවත් වන මට මගේ රටේ දරුවන් ගැන කණගාටුවක් දැනෙයි. මසට හදන ගවයන් සේ විභාග සඳහාම නිෂ්පාදනය කරනු ලබන ළමයින් දැකීම කොයි තරම් අභාග්‍යයක්ද?

වරද ඇත්තේ දරුවන් අත නොව ඒ දරුවන් වැරදි මගකට යොමුකරවන දෙමාපියන් අත යයි මම සිතමි.

මේ අභාග්‍ය සම්පන්න තත්වය නිර්මාණාත්මක ලෙස ඉදිරිපත් කළ යශෝධරා සරච්චන්ද්‍ර සහ කුසුම්සිරි ලියනාරච්චි ගේ ටියුෂන් මැජික් ළමා නාට්‍යය නරඹමින් සිටියදීත් මගේ සිතට වද දුන්නේ ඒ කරුණාම ය.

සෞන්දර්යය නොහඳුණන දරු පරපුරක් නිෂ්පාදනය කරන දෙමාපියන් සහ ඒ තරගයෙන් පීඩා විඳින දරුවන්ගේ ශෝකාලාපය කුසුම්සිරි සහ යශෝධරා ඉදිරිපත් කර ඇති ආකාරය සැබැවින්ම පැසසුම් කටයුතු ය. දරුවන් විෂයගත අධ්‍යාපනයේ නිරත විය යුතු නමුත් ඔවුන්ගේ සම්පූර්ණ ජීවිතයම ඒ අධ්‍යාපනය බවට පත් කරන්නට වැඩිහිටියන්ට අයිතියක් තිබේද? දරුවන් මත ඒ සා පීඩනයක් පැටවීම කෙතරම් දුරට සාධාරණ ද? මේ කාරණා සාකච්ඡා කිරීම සඳහා නිර්මාණය කෙරුණ ටියුෂන් මැජික් නරඹද්දී මට සිතුණේ යශෝධරා සහ කුසුම්සිරි සැබැවින්ම මැජික්කාරයන් දෙපළක් කියා ය. කාරණා කීපයක් නිසා ය.



බිමල් ප්‍රනාන්දු සහ පංචාලි ලියනාරච්චි

පළමුව අපේ දරු දැරියන් ලවා සිංහල දෙබස් නිසි උච්ඡාරණයකින් යුතුව ඉදිරිපත්කිරීමේ මැජික් එක ය. දෙවෙනුව ඒ අනුසාරයෙන් බිහිවන රංගනය නිසි ලෙස වේදිකාව මත පිහිටුවීමේ මැජික් එක ය. තෙවනුව රසබර පදවැල් පමණක් නොව මියුරු සංගීතයෙන් නාට්‍යය වර්ණවත් කිරීමේ මැජික් එකය.

මේ සියල්ල ඉතා පහසුවෙන් ළඟාකරගත් ජයග්‍රහණ නොවේ. ඒ වෙනුවෙන් කළ යුතු කැපකිරීම අප විස්තර කර දිය යුතු නොවේ. එය වටහා ගන්නට ඕනෑම කෙනෙකුට හැකි ය. ඒ කැපවීමේ ගුණය වෙනුවෙන් යශෝධරා සහ කුසුම්සිරි යුවලට අප ස්තුතිවන්ත විය යුතු ය.

නාට්‍යයක් වේදිකාගත කිරීම විශාල අභියෝගයකි. නාට්‍යය ළමා නාට්‍යයක් වූ විට ඒ අභියෝගයේ ප්‍රමාණය දෙගුණ තෙගුණ වෙයි.



හසිනි වල්පොල

මෙයට පෙර බොහෝ වතාවල ඔප්පු කර පෙන්වූ ආකරයටම කුසුම්සිරි සහ යශෝධරා ඒ අභියෝගයට සාර්ථකව මුහුණ දෙයි.

කුසුම්සිරි අතින් ලියැවෙන ටියුෂන් මැජික් නාට්‍යයේ පිටපත ප්‍රභල ය. නාට්‍යෝචිත අවස්ථා හොඳින් ග්‍රහණයට ගෙන ඇත. යශෝධරා නිර්මාණය කළ සංගීතයද එයටම ගැළපේ. විශේෂයෙන් සජීවී සංගීතය නාට්‍යයට විශාල ආලෝකයක් පසයයි. නාට්‍යයේ රඟ පෑ දරු දැරියන් සේම සංගීතය සැපයූ දරු දැරියන්ද සිය භූමිකාව මැනැවින් ඉටුකර ඇත බව පෙනෙයි. වැඩිහිටි නලු නිලියන් ලෙස නාට්‍යට සම්බන්ධ වන හසිනි වල්පොල බිමල් ප්‍රනාන්දු ප්‍රසාද් විජයබාහු නිරෝෂා ප්‍රනාන්දු සහ දෙමාපියන් ලෙස රඟ පෑ නලු නිළියෝ නාට්‍යයේ ප්‍රාණවත් බව රැකගනිති. සිරිමල් නම් වන සොරදෙටුවා ලෙස රඟපෑ නිතිෂ් අතලගේ සහ නවෝදා ලෙස රඟ පෑ පංචාලි ලියනාරච්චි පිළිබඳව සඳහන් නොකළොත් එය අඩුවකි.

හසිනි ඉලංගරත්න ගේ නර්තන නිර්මාණ ටියුෂන් මැජික් නාට්‍යයට ආභරණයකි. ඒ නර්තන නිර්මාණ වෙනුවෙන් ඇයට විසල් පැසසුමක් හිමිවිය යුතුම ය. පසුතල නිමැවුම්ද අපූරුය



හසිනි ඉලංගරත්න

විගාමික දෙමාපියන්ගේ දූ දරුවන්ට අපේ කම කියා දෙන්නට කුසුම්සිරි ලියනාරච්චි නම් වන නිර්මාණකරුවා සහ යශෝධරා සරච්චන්ද්‍ර නම් වන නිර්මාණකාරිය අප අතර සිටීම අපේ භාගයයකි. ඔවුන් මේ කරමින් සිටින්නේ වචනයෙන් විස්තර කළ නොහැකි දැවැන්ත කාරියකි. ඒ වෙනුවෙන් ඔවුන් දෙදෙනාට අපේ කෘතවේදීත්වය හිමිවිය යුතුය. එසේම ඔවුන් තනි නොකරන්නටත් ඔවුන් රැක ගන්නටත් අපේ සමාජය නිබඳ උත්සාහයක යෙදිය යුතුය. ඒ, අපේ දරුවන්ට සුන්දරත්වය උගන්වන අතළොස්සක් වූ පිරිස අතරේ ඔවුන් පෙරමුණේ සිටින බැවිනි.



ජගත් ජේ එදිරිසිංහ